## සංක්ෂිප්තය

අධ්‍යාපනය ගුණාත්මක වශයෙන් වර්ධනය වීම තුලින් රටට අවශ්‍ය සදාචාර සම්පන්න පුරවැසියන් බිහි කිරීමේ කේන්ද්‍රස්ථානයක් ලෙස පාසල මැනවින් පවත්වාගෙන යාමේ වගකීම විදුහල්පතිවරයාට පැවරී ඇත. මේ නිසා බෙහෙවින්ම සංකීර්ණතාවයෙන් යුතු සුවිශේෂ කාර්යභාරයක් විදුහල්පති භූමිකාව වෙත ගොනුවී තිබෙන බව විද්‍යාමාන වේ. විශේෂයෙන් වේගවත් සමාජ පරිවර්තනය හා අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සිදුවන යුගයක මෙම වෙනස්වීම් වලට කෙලින්ම මුහුණ දීමට සිදුවන විදුහල්පති ධුරය පිළිබඳ විග්‍රහ කිරීම කාලීන අවශ්‍යතාවයකි. එම නිසා මෙම අධ්‍යයනයේදි හිඟුරක්ගොඩ අධ්‍යාපන කාලාපය තුළ ඇති 1 AB සහ 1 C පාසල්වල ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා කටයුතු කරනු ලබන විදුහල්පති ධුරයේ කාර්යභාරය පිළිබඳව විමර්ශනය කරන ලදි.

අධ්‍යයනයේ සුවිශේෂ අරමුණු වන්නේ, පාසල්වල විදුහල්පතිවරුන් විසින් අනුගමනය කරන නයකත්ව භූමිකා සහ කුසලතාවල ස්වභාවය විමසා බැලීම, පාසල්වල ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා විදුහල්පති අනුගමනය කරන ක්‍රමෝපායන් විමසා බැලීම, සහ ඔහු තම කාර්ය මෙහෙය වීමේදි  මුහුණදෙන අභියෝග විමසා බැලීම, සහ විදුහල්පති තම කාර්ය මණ්ඩලයෙන් වැඩ කරවා ගැනීම සඳහා අනුගමනය කරන නායකත්ව ශෛලීන් මොනවාදැයි විමසා බැලීම විය.

මේ අනුව පළමු පරිච්ජේදය තුලින් පර්යේෂණ ගැටලුව හැදින්වීම, අධ්‍යයනයේ පසුබිම, අධ්‍යයනයේ  අරමුණු, අධ්‍යයනයේ  ක්‍රමවේද, අධ්‍යයනයේ  සීමා, අධ්‍යයනයේ වැදගත්කම, අධ්‍යයනයේ සැලැස්ම, සාරාංශය යනාදිය පිළිබඳව කරුණු ඉදිරිපත් කරනලදි. දෙවන පරිච්ජේදය තුලින් ඵලදායි පාසලක ස්වභාවය හා ලක්ෂණ, ඵලදායිතාව නිර්ණය කිරීමේ නිර්ණායක, පිළිබඳ සාහිත්‍ය විමර්ශනය, ඵලදායි පාසලක් බිහිකිරීම සඳහා විදුහල්පති නායකත්ව භූමිකාවේ පෞරුෂ ලක්ෂණ, ඉටුකල යුතු කාර්යභාරය, පරිපාලන ශෛලීන්ගේ වෙනස්කම් පිළිබඳ සාහිත්‍ය විමර්ශනය කරන ලදි.  තෙවන පරිච්ජේදය මඟින් පර්යේෂණ ක්‍රම ශිල්පය, නියැදිය තෝරාගත් ආකාරය, දත්ත රැස් කිරීමට යොදාගත් උපකරණ හා දත්ත විශ්ලේෂණය පිළිබඳව කරුණු දක්වන ලදි. සිව්වන පරිච්ජේදය මගින් දත්ත විශ්ලේෂණය තුලින් ඵලදායි නිගමනත් එම නිගමන සලකා බැලීමෙන් ඵලදායි පාසලක් බිහිකිරීම සඳහා විදුහල්පති ධුරය පිළිබඳ යෝජනාත් ඉදිරිපත් කරන ලදි.පාසල් ඵලදායිතාවය ඉහළ නැංවීම සඳහා විදුහල්පති විසින් ඉටු කරන කාර්යභාරය පිළිබඳ කෙරෙන මෙම අධ්‍යයනය හිඟුරක්ගොඩ අධ්‍යාපන කලාපය තුළ පවතින 1AB සහ 1C යන පාසල් වර්ග දෙකෙන් පාසල් දහයකට පමණක් සීමා කරන ලදි. හිඟුරක්ගොඩ අධ්‍යාපන කාලාපය තුල වූ 1AB සහ 1C පාසල්වල විදුහල්පතිවරුන් සහේතුක නියැඳිකරණය මගින් මෙම අධ්‍යයනය සඳහා යොදා ගන්නා ලදි. විදුහල්පතිවරුන් පිළිබඳ දත්ත ලබා ගැනීම

සඳහා ප්‍රශ්නාවලි, සම්මුඛ සාකච්ඡා සහ නිරීක්ෂණ යන උපකරණ යොදා ගැනුනි. එම උපකරණ පදනම් කරගෙන ලබාගත් දත්ත විශ්ලේෂණය කිරීම සඳහා විස්තරාත්මක සංඛ්‍යාන ශිල්පී ක්‍රම යටතේ දැක්වෙන ප්‍රතිශත, වගු, උපයෝගි කරගන්නා ලදි. මේ ආකාරයට දත්ත විශ්ලේෂණයෙන් විදුහල්පති තනතුර සඳහා අවුරුදු 40 - 50 වයස් සීමාව සුදුසු බව සහ ඵලදායි පාසල් බිහිකිරීම සඳහා විදුහල්පති කාර්ය මෙහෙයවීම සඳහා අවශ්‍ය නිතිමය වශයෙන් ලබාදිය යුතු බලතල ලබාදිම, ශාස්ත්‍රිය අධ්‍යාපනයත් සමග වෘත්තිය පුහුණුවද ඵලදායි කාර්යභාරයක් ඉටු කිරිමට වැදගත්වන බව නිගමනය විය.

තවද මෙම අධ්‍යයනයෙන් ,විදුහල්පතිගේ පාසල් කළමනාකරණ භූමිකාව සහ කුසලතාව, සිදුකරනලද දත්ත විශ්ලේෂණය සහ අර්ථකථනයට අනුව ප්‍රශස්ත මට්ටමක පවතින බව අනාවරණය විය. තවද පාසල ඵලදායිතාවයෙන් ඉහළට රැගෙන යාම සඳහා විදුහල්පති සහභාගිත්ව කළමනාකරණ ශෛලිය, මානුෂික සම්බන්ධතා ශෛලිය, අවස්ථාවෝචිත ශෛලිය අනුගමනය කරන බව මෙම අධ්‍යයනයෙන් අනාවරණය විය පාසලක් ඵලදායිතාව කරා මෙහෙයවීමේදි විදුහල්පතිවරයාට ගැටලු හා අභියෝග රැසකට මුහුණ දීමට සිදුවන අතර, නියදියට අයත් පාසල් වර්ග දෙකටම (1AB සහ 1C)එම ගැටලු පොදු බව නිගමනය විය. එසේම,ශ්‍රී ලංකාවේ සියලුම පාසල් ඵලදායි ආයතන බවට පත් කිරිම සඳහා දිප ව්‍යාප්තව පුළුල් වැඩපිලිවෙළක් ක්‍රියාවට නැංවීමට පියවර ගැනිම විදුහල්පති කාර්යභාරයේ ඵලදායිතාව සහ සංවර්ධනය සඳහා සුදුසු බව යෝජනා කළහැකි වියපාසලක ඵලදායිතාවය ඉහළ නැංවිම සඳහා පාසලේ නියමුවා වන විදුහල්පතිගේ අධ්‍යාපන හා වෘත්තිය සුදුසුකම් වැදගත් සාධකයක් වේ. ඒ අනුව නියදියට අයත් 1AB හා 1C පාසල්වල විදුහල්පතිවරුන්ගේ අධ්‍යාපන හා වෘත්තිය සුදුසුකම් ඉහළ මට්ටමක පවතින බවද මෙම අධ්‍යයනයෙන් අනාවරණය කරගන්නා ලදි.

## Abstract

As the center of moulding worthy citizens for the country through the qualitative education, the principal holds a responsible role in the school. It is obvious that the role of a principal consists a very complex working system. So to analyze the principal ship which faces a lot of social and educational reforms have become a need of today. Therefore through this research, I investigate how the principal increase the productivity of their school in 1AB, 1C in Hingurakgoda Zone. The main objectives of the Education are, leadership role of the principal, analyze the skills, the ways and means used by the principal to increase the productivity of schools, the challenges he face and how he make use of his staff for the development of the school.

In the first chapter, the following topics have been discussed .The introduction and the background method of the research, limitation, importance, plan and the summary of the research. The characteristics, criteria's of an effective school and the personality of the principal to administrate the school are analyzed in the second chapter. Third chapter is consisted of the sample produces gathering and analyzing facts. After analyzing the facts calculation and the suggestions to build a productive school under the guidance of the principal is highlighted in the fourth chapter I selected 10 schools of 1AB and 1C as sample schools in Hingurakgoda Zone and used questionnaire to gather information. Interviews and observations were the other tools. To analyze data the statistical techniques were used.

Conclusion of the research, is the principal should be in 40-50 age limit, should have legal authorization to form productive schools, and importance of having a professional training. It was exposed when appointing as principals, having a professional training is compulsory and providing 1AB and 1C schools under the consideration of educational and professional qualifications. According to the conclusion of the research, the principal of the selected 1AB and 1C are performing their duties very effectively to build a productive school.